// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2302/34 – 2022 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා – 2022.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 මැයි මස 28 වැනි දින අංක 1812/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 167 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/94.
ඉඩම් අත්කර ගැනීමේ
නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/KB/09.
2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 533 F- බොරලැස්ගමුව බටහිර C ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බොරලැස්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2019/685 හා 2020.01.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'බී' – කඳුරුකොටුව කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0558**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ කො.9464 මූලික පිඹුරේ කැබලි අංක 181; නැගෙනහිරට: කො.9464 මූලික පිඹුරේ කැබලි අංක 181 සහ කැබලි අක්ෂර ඒ; දකුණට: කො.9464 මූලික පිඹුරේ කැබලි අංක 181 සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

EOG 10 - 0187